(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(3).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 ජූලි 24 සිකුරාදා**

---

**2026 අගෝස්තු 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 240 — වැඩසටහන 02 — † 2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හැත්තෑ එක්දහස් හත්සියයක් (රු. 71,700,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **240** | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 71,700,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 71,700,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2026 ජූලි 24 දින ඉදිරිපත් කරන ලද 2026 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රු. 520,000,000,000

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථා ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව, 2026.02.05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති වශයෙන් පත් කර ඇති හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2026.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව අංක අමප/26/1258/801/020 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එල්.එස්.අයි. ජයරත්න මහත්මියට පහත පරිදි වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය එම තනතුරට පත් කළ 2026.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-4 වැටුප් කේතයේ (175,000-12x5,300-238,600) 5 වන වැටුප් පියවරෙහි පිහිටුවා, ඒ අනුව එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 196,200/- ක වැටුප් පියවරට අනුරූපීව උපලේඛන III ට අනුව රු. 170,528/- වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට; සහ

(ආ) එම වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට සහ උක්ත චක්‍රලේඛයේ කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව වැටුප පරිවර්තනය කිරීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පරිදි මාසික වැටුප් ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*

සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2026 අගෝස්තු 05 බදාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2026 අගෝස්තු 07 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 128/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගුරු හිඟය සහ ඩිජිටල් අධ්‍යාපන ගැටලු සඳහා විසඳුම් ලබා දීම,— වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා වූ ගුරු පුරප්පාඩු දිස්ත්‍රික් මට්ටමේ පත්වීම් තුළින් පිරවීමටත්, එම ප්‍රදේශවල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා නවීන පරිගණක විද්‍යාගාර සහ විධිමත් අන්තර්ජාල පහසුකම් ලබා දීමටත් සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්වල සිසුන්හට අමතර අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා විශේෂ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමටත් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 129/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම,— උණ, වේවැල්, පන් හා කිතුල් ආදී ශාකවල කඳන්, ව්‍යාජ කඳන් හා පත්‍ර ප්‍රයෝජනයට ගනිමින් සිදුකරනු ලබන සාම්ප්‍රදායික කර්මාන්ත මඟින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා සංචාරක ක්ෂේත්‍රයන් සඳහා විශේෂ දායකත්වයක් ලබා දිය හැකි හෙයින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ හා සංචාරක ක්ෂේත්‍රයේ වර්තමාන පිබිදීමට සමගාමීව එකී සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමටත්, එම නිෂ්පාදන සඳහා වන වෙළෙඳපොළ වර්ධනය කිරීමටත්, ඒ සඳහා නිල පිළිගැනීමක් ලබා දීමටත්, මහා පරිමාණ කර්මාන්ත ඇති කිරීම සඳහා එම වගාවන් ප්‍රවර්ධනය කිරීමටත්, ඒ සඳහා ව්‍යවසායකයන් දිරිමත් කිරීමටත්, එම ශිල්පීන්ගේ ශ්‍රමයට හා කුසලතාවන්ට ඉහළ වටිනාකමක් ලබා දීමටත් සහ ඔවුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමටත් අවශ්‍ය මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 130/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— මැදපෙරදිග කලාපයේ මේ වනවිට උද්ගත වී ඇති වාතාවරණය මත ඉන්ධන මිල ඉහළ යෑමේ තත්ත්වය හමුවේ මහජනයා විශාල වශයෙන් පොදු ප්‍රවාහන සේවා වෙත නැඹුරු වීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන හෙයින් ද, දිනපතා විශාල පිරිසක් රාජකාරි හෝ ව්‍යාපාරික අවශ්‍යතාවයන් සඳහා පුත්තලම මාර්ගයේ ගමන් ගන්නා හෙයින් ද, එම මගී ජනතාවට ප්‍රමාණවත් සේවාවක් ලබා දීම සඳහා පුත්තලම-කොළඹ අතර දුම්රිය ධාවනය ඉහළ දැමීමට වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2026 අගෝස්තු 18 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1184/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, තමිල්චෝලෙ විද්‍යාලය නමින් පාසලක් පැවැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පාසලේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට සහ 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අවසන් වරට පෙනී සිට ඇති වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ඉහත පාසලේ නාමය කවරේද;

(v) එම පාසලේ නාමය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබුයේ කවුරුන් විසින්ද;

(vi) ඊට හේතු කවරේද;

(vii) එම සංශෝධනය කරනු ලැබූ දිනය කවරේද;

(viii) එම පාසලේ නාමය සඳහා එම පාසලේ නිර්මාතෘවරයාගේ හෝ පාසල ආරම්භ කිරීමට පුරෝගාමීවූ පුද්ගලයෙකුගේ නමක් යොදා ගත හැකිද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1673/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සින්න උල්ල, අරුගම්බේ, සර්වෝදයපුර, ජලාල්දීන් චතුරශ්‍රය, කුඩා කල්ලිය, විස්කි පොයින්ට්, කොට්ටුක්කල් සහ ලයිට් හවුස් වැනි සංචාරක ප්‍රදේශවල නිවාඩු නිකේතන පවත්වාගෙන යන පුද්ගලයන් සතු ඉඩම් සඳහා රජය විසින් මැනුම් සිදුකර ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) එම ලිපිලේඛන නොමැති නිවාඩු නිකේතන, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(iii) ඒ හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය සභාවට අදාළ ව්‍යාපාර බදු අය කිරීමට නොහැකිවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් සිදුකර 'උරුමය' ඔප්පු කඩිනමින් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේද;

(v) එසේ සකස් කරන මිනින්දෝරු සැලසුම් භාවිතා කර එම ඉඩම් 'උරුමය' යෝජනා ක්‍රමයට ඇතුළත් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1681/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) මේ වනවිට මෙරට පිහිටි ප්‍රධාන හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැපැල් සේවකයින්ට තැපැල් බෙදාහැරීම සඳහා යතුරුපැදි ලබාදිය යුතු බවට ඉල්ලීමක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ඉල්ලීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1910/2026

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන පලතුරු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පලතුරු වර්ගවල නම් කවරේද;

(iii) එම පලතුරු වර්ග අතරින් අපනයනය කිරීම හේතුවෙන් දේශීය වෙළඳපොළ තුළ හිඟව පවතින පලතුරු වර්ග කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා පලතුරු අපනයනය කිරීම තුළින් උපයන ලද ආදායම කොපමණද;

(v) මෙරට පලතුරු වගාව ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/2026

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ප්‍රථම සමුපකාර සමිතිය ලියාපදිංචි කරන ලද වර්ෂය කවරේද;

(iii) එම සමුපකාර සමිතිවලට අයත් සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට සක්‍රිය හා අක්‍රිය සමුපකාර ග්‍රාමීය බැංකු සහ සමුපකාර ප්‍රාදේශික වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බුලත්කොහුපිටිය සහ යටියන්තොට සමුපකාර සමිති ලියාපදිංචි කරන ලද වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සමිතිවලට අයත් ප්‍රාදේශික, ග්‍රාමීය බැංකු සහ කෝප්සිටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට එම සමිතිවලට අයත් සක්‍රිය සහ අක්‍රිය ප්‍රාදේශික කවරේද;

(iv) එම ප්‍රාදේශික අක්‍රිය වීමට බලපාන ලද හේතු කවරේද;

(v) පසුගිය වර්ෂ 10 තුළ එම සමුපකාර සමිතිවල වාර්ෂික විගණන නිසි පරිදි සිදුකර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2094/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමීප ඥාතීන් නොමැති, ස්ථිර ජීවනෝපායක් නොමැති සහ කුලී නිවාසවල ජීවත් වන කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින වයෝවෘද්ධ පුද්ගලයන් හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, මේ දක්වා හඳුනාගෙන ඇති එවැනි වැඩිහිටියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැඩිහිටියන්ගේ සුරක්ෂාව සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන සඳහා රජය විසින් දක්වන අනුග්‍රහය කවරේද;

(v) සමස්තයක් ලෙස වැඩිහිටියන්ගේ සුරක්ෂාව සම්බන්ධ ගැටලුව වාර්ෂිකව වර්ධනය වන ප්‍රවණතාවක් පවතින බව දන්නේද;

(vi) වැඩිහිටියන්ගේ සුරක්ෂාව සහ සුභසාධනය උදෙසා යෝජිත ඉදිරි සැලසුම් තිබේද;

(vii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2108/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට සහ වැවිලි සමාගම්වලට අයත්ව තිබූ ඉඩම් අත්පත් කරගෙන ක්‍රියාත්මක කර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවලට අයත් නිවාස සංඛ්‍යාව ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් ව්‍යාපෘතිය යටතේ නිවාස සහ භූමිය සඳහා ඔප්පු නිකුත් කර ඇති සහ නිකුත් කර නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙතෙක් ඔප්පු ලබා නොදුන් ප්‍රතිලාභීන්ට ඔප්පු ලබාදීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව ආබාධ සහිත ජනගහනය එක් එක් ආබාධ වර්ගය අනුව සංඛ්‍යාත්මකව සහ ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජනගහනයෙන් ශ්‍රම බලකායට අයත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ආබාධ වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්ත ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2026 වර්ෂයේ අයවැය මඟින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය සේවයේ 3%ක කෝටාව ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ආබාධ සහිත පුද්ගලයන් අතර රැකියා විරහිත සංඛ්‍යාව සහ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන් රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ රැකියාවලට යොමු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2172/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවය යටතේ ගැනෙන රැකියා කවරේද;

(ii) එම සේවයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු රාජ්‍ය ආයතනවල කටයුතුවලට බාධාවක්වී තිබෙන බව පිළිගන්නේද;

(v) එසේ නම්, පුරප්පාඩු පිරවීමට සහ වෘත්තීය ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2177/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ කාන්තාවන් සඳහා 1996 වර්ෂයේ සිට ස්ථාපිත කළ රජයේ නේවාසික ප්‍රතිකාර මධ්‍යස්ථාන සියල්ල මේ වනවිට අසාර්ථකවී වසාදමා ඇති බවත්;

(ii) 2025 වර්ෂයේදී 'තලංගම' ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කාන්තා ප්‍රතිකාර අංශයේ සිදුවූ ආරක්ෂක බිඳවැටීම හේතුවෙන් එය වසා දැමීමට සිදුවූ බවත්;

(iii) පිරිමි ඇබ්බැහිවූවන් සඳහා භාවිතා කරන ක්‍රමවේද ඒ ආකාරයෙන්ම කාන්තාවන්ට යෙදීම හේතුවෙන් කාන්තාවන්ට විශේෂිතවූ ජීව විද්‍යාත්මක, මානසික, ගර්භණීභාවය සහ දරු රැකවරණය වැනි අවශ්‍යතා නොසලකා හැර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2025 වර්ෂයේ ප්‍රචණ්ඩකාරී සිදුවීමෙන් පසු ඉල්ලා අස්වූ කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) කාන්තාවන් සඳහා ගැළපෙන විද්‍යාත්මක ප්‍රතිකාර රාමුවක් ස්ථාපිත කිරීමටත්, කොළඹ දිස්ත්‍රික්කයේ මත් ද්‍රව්‍ය භාවිතා කරන නාගරික දිළිඳු පිරිමි පුද්ගලයන් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් අගනගරය තුළ පිහිටුවීමටත් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 අගෝස්තු 18 අඟහරුවාදා)**

887/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී එරාවූර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේනම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේනම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවූර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

888/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද:

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

889/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අගෝස්තු 19 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

32/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ විවෘත කළ දිනය කවරේද;

(ii) එම ගුවන්තොටුපළ විවෘත කළ දින සිට මේ දක්වා වාර්ෂික වියදම සහ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගුවන්තොටුපළේ වාර්ෂික ආදායම ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

139/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 සහ 2022 යන වර්ෂවල ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය කොපමණද;

(ii) එම පොහොර ආනයනය කරන ලද සමාගම්/ආයතනවල නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) විගණන වාර්තාවලට අනුව, එම පොහොර ආනයනය කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් සිදුවූ පාඩුව කොපමණද;

(v) ඊට වගකිව යුතු පුද්ගලයන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(vi) ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

684/2025

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කය තුළ පිහිටි පුරාවිද්‍යා වැදගත්කමකින් යුත් ස්ථාන කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති පුරාවිද්‍යා සොරකම් සහ විනාශ කිරීම් සම්බන්ධ සිදුවීම් සංඛ්‍යාව කොපමණද;

(iv) දිස්ත්‍රික්කය තුළ සේවයේ යොදවා ඇති දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) දිස්ත්‍රික්කය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(vi) පවතින සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1495/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වනඅලින් විසින් මිනිස් ජීවිත සහ දේපළවලට හානි සිදු කරන බව දන්නේද;

(ii) එම හානි වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) දිස්ත්‍රික්කයේ මේ වනවිට ඉදිකර ඇති අලි වැටවල මුළු දුර ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට ඉදිකර ඇති අලි වැටවල් කඩා බිඳ දමමින් වනඅලින් ජනාවාස සහ වගා බිම්වලට ඇතුළු වන බව දන්නේද;

(v) එය වැළැක්වීම සඳහා මෙම වර්ෂය තුළ අමතර අලි වැට ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිස්ත්‍රික්කය තුළ අලුතින් අඩවි වන කාර්යාල 05ක් ස්ථාපිත කිරීමට හැකියාව තිබේද;

(ii) උප අඩවි වන කාර්යාල 14ක් ස්ථාපිත කිරීමට හැකියාව තිබේද;

(iii) ඒ සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2055/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි 'මරගල' කඳුවැටිය පාරිසරික ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේද;

(ii) එසේ නම්, එහි භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම පාරිසරික ආරක්ෂණ කලාපයට අදාළ මායිම් සලකුණු කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර තිබේද;

(iv) එම කඳුවැටියේ රක්ෂිත සීමාව තුළ නීතිවිරෝධී ලෙස පදිංචිවීම් හෝ අනවසර වගාබිම් පවත්වාගෙන යෑම පිළිබඳව වාර්තාවී තිබේද;

(v) එසේ නම්, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සහ රක්ෂිතය ආරක්ෂා කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මරගල කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද දිනය කවරේද;

(ii) එලෙස ප්‍රකාශයට පත්කිරීමට පෙර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කර තිබේද;

(iii) එසේ නම්, නිරවුල් කරන ලද භූමි ප්‍රදේශය තුළ පෞද්ගලික ඉඩම් වශයෙන් නිරවුල් කර ඇති ඉඩම් තිබේද;

(iv) පාරිසරික ආරක්ෂණ කලාපය ලෙස ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් නිරවුල් කරන ලද පෞද්ගලික ඉඩම් භාවිතයට බාධා ඇතිවී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු පාසල්වල ගුරු හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පාසල් සඳහා ගුරු සහායකයින් බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍රයක් නිකුත් කර තිබේද;

(iii) මේ වනවිට අත්හිටුවා ඇති එම බඳවාගැනීම් නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) වතු පාසල් සඳහා ගුරු සහායකයින් බඳවාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විකල්ප ක්‍රියාමාර්ග තිබේ නම්, ඒවා කවරේද;

(v) ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමේ සංකල්පය අනුව, නාම පුවරුවට පමණක් සීමාවී ඇති වතු පාසල්, ජාතික අධ්‍යාපන පද්ධතියට අන්තර්ග්‍රහණය කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2128/2026

ගරු සුජීව දිසානායක මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව මේ දක්වා සහභාගිවී ඇති ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් තරග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් ක්‍රීඩා තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගන පිහිටා තිබේද;

(ii) දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ක්‍රීඩකයන්ගේ නම් සහ ඔවුන් නියෝජනය කළ පාසල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඩී.බී. වෙලගෙදර ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගනයක් වන්නේද;

(ii) එම ක්‍රීඩාංගනයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරග සංඛ්‍යාව කොපමණද;

(iii) ක්‍රීඩාංගනයේ අවසන් වරට ජාත්‍යන්තර ක්‍රිකට් තරගයක් පවත්වා ඇති දිනය කවරේද;

(iv) මෙම ක්‍රීඩාංගනයේ අයිතිය පැවති ආයතනය කවරේද;

(v) මේ වනවිට වෙනත් ආයතනයකට එම ක්‍රීඩාංගනය පවරා තිබේද;

(vi) එසේ නම්, එලෙස අයිතිය පවරා ඇති පදනම කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/2026

ගරු දිනේෂ් හේමන්ත මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේදී සුනඛයන් සපා කෑම හේතුවෙන් ජලභීතිකා රෝගය වැළඳී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂයේදී ජලභීතිකා රෝගීන් සඳහා ප්‍රතිකාර සහ එන්නත්කරණ කටයුතු වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(iii) සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීම සඳහා එම වර්ෂයේදී වෙන් කළ මුළු මුදල කොපමණද;

(iv) එම මුදල් භාවිතා කොට වන්ධ්‍යාකරණයට ලක්කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(v) සුනඛයින් වන්ධ්‍යාකරණ වැඩසටහන සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශයට වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(vi) එම මුදල් භාවිතා කර 2026 වර්ෂයේ මේ වනවිට වන්ධ්‍යාකරණයට ලක් කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(vii) අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීමේ වැඩසටහනේ ස්වභාවය පිළිබඳව කෙටි විස්තරයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2181/2026

ගරු චමින්ද ලලිත් කුමාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44 බී, කලුඅග්ගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කැබැල්ලගහලන්ද සුසාන භූමියට අයත් ඉඩමෙන් කොටසක් පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති බවත්;

(ii) එම ඉඩම් කොටස නැවත සුසාන භූමියට ලබා ගැනීම සඳහා ප්‍රදේශවාසීන් සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය දැනුම්වත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සුසාන භූමිය බලහත්කාරයෙන් භාවිතා කරනු ලබන පුද්ගලයන්ගෙන් එසේ භාවිතා කරනු ලැබූ කාලසීමාව සඳහා යම් මුදලක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

(ii) රජය සතු ඉඩමක් පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් එම පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2188/2026

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'අපි වෙනුවෙන් අපි' අරමුදල පිහිටුවා ඇති පනත සහ එහි ප්‍රධාන කාර්යභාරය කවරේද;

(ii) අරමුදල මඟින් නිවාස ආධාර ලබාදීම සඳහා සුදුසුකම් ලබන සන්නද්ධ සේවා සාමාජිකයින් කවුරුන්ද;

(iii) අරමුදලේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන නිලධාරින් කවුරුන්ද;

(iv) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අරමුදලේ මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක කළ යුතු බවත් අරමුදල රජයේ විගණනයකට ලක්කළ යුතු බවත් පිළිගන්නේද;

(ii) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අරමුදල යටතේ ක්‍රියාත්මක වන ‘පූර්ණ නිවාස’ සහ ‘අර්ධ නිවාස’ ව්‍යාපෘති යනු කවරේද;

(ii) නිවසක් මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට ලබාදෙන මූල්‍ය ආධාර ප්‍රමාණය තීරණය කරනු ලබන පදනම කවරේද;

(iii) මේ වනවිට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ණය බරින් පීඩාවට පත් රණවිරුවන් සඳහා අරමුදල මඟින් මූල්‍යමය සහන ලබාදීමේ හැකියාවක් තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 අගෝස්තු 19 බදාදා)**

890/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ ‘දීමනා පත්‍ර’ හෝ ‘ඉඩම් බලපත්‍ර’ ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

891/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

892/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 අගෝස්තු 20 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

369/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තුව විසින් කාලගුණික තොරතුරු රැස්කරනු ලබන ක්‍රමවේද සහ එක් දිනකදී දත්ත ලබා ගනු ලබන වාර ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දෙපාර්තමේන්තුව විසින් ලබා ගන්නා තොරතුරු හුවමාරු කරගනු ලබන ජාත්‍යන්තර ආයතන කවරේද;

(iv) කාලගුණ තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේද සහ දත්ත, ජාත්‍යන්තර ආයතන සමඟ හුවමාරු කර ගැනීම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන්නේද;

(v) එම දෙපාර්තමේන්තුව වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

473/2025

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ පිහිටුවා ඇති මුළු නිදහස් වෙළඳ කලාප සංඛ්‍යාව සහ එක් එක් කලාපයේ ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කර්මාන්තශාලාවල සිදු කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය කවරේද;

(iii) එම නිෂ්පාදනවලට නිමි ඇඳුම් සහ අනෙකුත් අපනයන නිෂ්පාදන ඇතුළත් වන්නේද;

(iv) එම කර්මාන්තශාලාවල සේවය කරන පිරිමි සහ කාන්තා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 05 තුළ එම නිෂ්පාදනවලින් උපයා ගන්නා ලද අපනයන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අපනයන ආදායම වැඩිකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

(iii) අපනයනකරුවන් සිය අපනයන ප්‍රවර්ධනය කිරීමේදී මුහුණ දෙන ගැටලු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

654/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේ සිට මේ දක්වා දුම්වැටි සඳහා බදු සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(ii) එම සංශෝධන කවරේද;

(iii) දුම්වැටි සඳහා අය කරන බදුවලින් වාර්ෂිකව රජයට ලැබෙන ආදායම කොපමණද;

(iv) අවසන් වරට සිදු කරන ලද බදු සංශෝධනයේදී දුම්වැටි කාණ්ඩයේ එක් නිෂ්පාදනයක් (සිගරට්ටුවක්) සඳහා අය කරන ලද බදු මුදල කොපමණද;

(v) බදු වැඩි කිරීමට පෙර එම එක් නිෂ්පාදනයක වෙළෙඳපොළ මිල කොපමණද;

(vi) බදු සංශෝධනයෙන් පසු එක් නිෂ්පාදනයක වෙළෙඳපොළ මිල කොපමණද;

(vii) දුම්වැටි නිෂ්පාදන මත බදු අය කිරීම මඟින් අපේක්ෂා කරන අරමුණ කවරේද;

(viii) රජයේ ආදායම වැඩි කර ගැනීමේ අරමුණින් දුම්වැටි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

706/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තල්විටිගල ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත් අත්සන් කරන ලද සමාගම්වල නම් කවරේද;

(iv) මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(v) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය නතර කර ඇති බව දන්නේද;

(vi) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

986/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා තැපැල් දෙපාර්තමේන්තුව ලැබූ මෙහෙයුම් ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක වන තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) අලුතින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත තැපැල් කාර්යාල කවරේද;

(iv) නව තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(v) මේ වනවිට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව සහ ඉන් වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) එම දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බම්බලපිටිය මුස්ලිම් කාන්තා විද්‍යාලයේ මේ වනවිට ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි කිහිපයක් වර්ෂ 75කට වඩා පැරණි බව දන්නේද;

(iii) එම ගොඩනැගිලි අතරින් මේ වනවිට භාවිතයට අපහසු සහ අබලන් ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1667/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඊශ්‍රායලයේ රැකියාවල යෙදී සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකිකයන් සඳහා ඉදිරියේදී නව රැකියා අවස්ථාවන් ඊශ්‍රායලයෙන් ලැබී තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ශ්‍රමිකයන් තෝරා ගන්නා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2182/2026

ගරු සුනිල් රත්නසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(iii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගතවූ සමාගම කවරේද;

(iv) ව්‍යාපෘති කාලසීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් වන්දි ගෙවා අත්පත් කරගෙන ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ගෙවා අත්පත් කරගත් ඉඩම් වර්තමානයේ භුක්ති විඳින පාර්ශ්වයන්/ පුද්ගලයන් කවරේද;

(iv) මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය කවරේද;

(v) ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට කරගෙන යාමට අදහස් කරන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2185/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාකරුවන්ට සිදුවූ හානි සම්බන්ධයෙන් වන්දි ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඉස්සන් කර්මාන්තය රටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන කර්මාන්තයක් වන බැවින්, එම කර්මාන්තයේ සංවර්ධනය සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) ඉස්සන් වගාකරුවන්ගේ නිෂ්පාදන අපනයනය කිරීමේදී පවතින ගැටලු හඳුනාගෙන තිබේද;

(vi) එසේ නම්, එම ගැටලු විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2191/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට පාසල් පද්ධතියේ විදුහල්පතිවරුන් ලෙස සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට, ශ්‍රී ලංකා විදුහල්පති සේවයට සහ ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදුහල්පතිවරයෙකු ලෙස කටයුතු කිරීමේදී ඉහත සේවා 03ට අයත් නිලධාරින්ට වැටුපට අමතරව හිමිවන දීමනා එක් එක් සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරින්ගේ උසස්වීම් සඳහා ජාතික පාසලක විදුහල්පතිවරයෙකු ලෙස සේවය කිරීම අත්‍යවශ්‍ය වන්නේද;

(iv) එසේ නම්, එලෙස සේවය කළ යුතු කාලසීමාව කොපමණද;

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරියෙකු II ශ්‍රේණියට සහ I ශ්‍රේණියට උසස්වීම සඳහා ගත වන කාලය කොපමණද;

(vi) එම උසස්වීම් සඳහා එම නිලධාරින් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 අගෝස්තු 20 බ්‍රහස්පතින්දා)**

893/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

894/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරලේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

895/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අගෝස්තු 21 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

785/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිසර ඩිපෝව සතුව මේ වනවිට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවේ මේ වනවිට ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) උතුරු කොළඹ ශික්ෂණ රෝහල රාගම නගරයේ පිහිටා ඇති බැවින් රාගම නගරයේ සිට උදෑසන, දහවල් සහ සවස් කාලවලදී දුරගමන් බස් රථ සේවා ආරම්භ කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

903/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීරාවෝඩෙයි රජයේ රෝහල දීර්ඝ කාලයක සිට සංවර්ධනය කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට පැමිණෙන රෝගීන් විශාල ලෙස අපහසුතාවයන්ට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහල සියලු පහසුකම් සහිත රෝහලක් බවට පත් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

910/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, මාළිගාවත්ත ප්‍රදේශයේ වකුගඩු රෝහලක් තිබෙන බව දන්නේද;

(ii) එම රෝහලේ වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය සහ සුළු සේවක තනතුරුවල මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

948/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පළමු වරට විදේශගතවූ ගෘහ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශගතවූ රටවල් කවරේද;

(iii) එම ගෘහ සේවකයන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන පුහුණුව ලබාගෙන සහ ලබා නොගෙන විදේශගතවී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාර්යාංශයේ චක්‍රලේඛ අනුව පළමු වරට විදේශගත වන සේවකයන් සඳහා ලබාදිය යුතු පුහුණුවේ ස්වභාවය කවරේද;

(v) නිසි පුහුණුවක් නොලබා විදේශගත වන පුද්ගලයන්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බව දන්නේද;

(vi) එසේ නම්, නිසි පුහුණුවක් නොලබා විදේශගත වීම වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1038/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකුවල නම් කවරේද;

(iii) 2000 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ එම ග්‍රාමීය බැංකු අතරින් බිඳ වැටී ඇති බැංකු සංඛ්‍යාව කොපමණද;

(iv) එම බැංකුවල නම් කවරේද;

(v) එම තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්ව සිටින තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(vi) එම තැන්පත්කරුවන්ට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබාදී ඇති සහන කවරේද;

(vii) එම බැංකුවල මූල්‍ය වංචා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ සිදු කර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1077/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඊශ්‍රායල-ඉරාන ගැටුම හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල සහ ආනයන පිරිවැය කෙරෙහි ඇතිවී තිබෙන බලපෑම තක්සේරු කර තිබේද;

(ii) ඉන්ධන මිල ඉහළ යාම, උද්ධමනය සහ ජීවන වියදම යනාදිය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති හදිසි අවස්ථා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉන්ධන ආනයන විවිධාංගීකරණය කිරීම හෝ දිගු කාලීන සැපයුම් ගිවිසුම් ඇති කර ගැනීම සඳහා කිසියම් උපාය මාර්ගයක් තිබේද;

(iv) වෙළඳ මාර්ගවල බාධා පැමිණීම හේතුවෙන් කොළඹ සහ හම්බන්තොට වරායන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කර තිබේද;

(v) නැව්ගත කිරීමේ රක්ෂණ වාරික සහ භාණ්ඩ ප්‍රවාහන පිරිවැය මඟින් ශ්‍රී ලංකාවේ වෙළඳාම කෙරෙහි බලපෑම් ඇති වන්නේද;

(vi) ගැටුමෙන් ඇති වන අතුරු බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධීකරණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තෙල් මිල ඉහළ යාම හේතුවෙන් ගෙවුම් ශේෂය, අයවැය හිඟය සහ ණය සේවාකරණය කෙරෙහි ඇති විය හැකි යැයි අපේක්ෂිත බලපෑම කවරේද;

(ii) අවදානමට ලක්විය හැකි ක්ෂේත්‍ර ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) මෙකී කම්පනවලින් ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සඳහා සූදානම් කර ඇති රාජ්‍ය මූල්‍ය හෝ මුදල් ප්‍රතිපත්තිමය මෙවලම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1249/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පස් පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) පස් පරීක්ෂා කිරීමේ අරමුණ කවරේද;

(iv) පස් පරීක්ෂා කිරීම සඳහා මේ වනවිට ස්ථාපිත කර ඇති විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(vi) 2024 වර්ෂයේ සිට මේ දක්වා පරීක්ෂා කර ඇති පස් සාම්පල් සංඛ්‍යාව, එම පස් සාම්පල් ලබා ගෙන ඇති ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1365/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් 2025 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ මුදල් පිළිබඳ විස්තර එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) තිල්ලෙයාරු-සම්බුක්කලප්පු, අඩ්ඩාලච්චේනෙ-කෝණාවත්ත යන ප්‍රදේශවල කාණු පද්ධතිවල පවතින අවහිරතා හේතුවෙන් අඩ්ඩාලච්චේනෙ, අක්කරපත්තුව සහ ආලයඩිවේම්බු ප්‍රදේශවල ජනතාව සෑම වර්ෂයකදීම ගංවතුර හේතුවෙන් පීඩාවට පත්වන බව දන්නේද;

(iii) එම කාණු පද්ධතිවල පවතින අවහිරතා ඉවත් කර එම ප්‍රදේශවල ජනතාව ගංවතුරෙන් පීඩාවට පත් නොවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1375/2025

ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින හීළෑ අලි-ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලි-ඇතුන් හිමියන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එම අලි-ඇතුන් සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර ලබාදීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(iv) එම අලි-ඇතුන් සම්බන්ධයෙන් පසු විපරමක් හා නිරන්තර සොයා බැලීමක් සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති යාන්ත්‍රණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1852/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය මැදිහත්වී විදේශ රැකියා අවස්ථා ලබා දීමේදී බඳවා ගැනීමේ පටිපාටියෙහි විනිවිදභාවය තහවුරු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) විදේශ රැකියා ලබාදෙන බවට පවසමින් සිදුකරන ජාවාරම් සහ වංචා වැළැක්වීමට හඳුන්වාදී ඇති විශේෂ විමර්ශන යාන්ත්‍රණය කවරේද;

(iii) එක් අයදුම්කරුවෙකු රැකියා කිහිපයක් සඳහා අන්තර්ජාලයෙන් අයදුම් කර පසුව ඒවා අතහැර දැමීමෙන් සිදුවන අවභාවිතයන් වැළැක්වීමට තොරතුරු තාක්ෂණික විසඳුමක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීමට සහ අකටයුතුකම් සිදුකරන ආයතනවල බලපත්‍ර අහෝසි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග මඟින් විදේශ රැකියා ක්ෂේත්‍රය දූෂණයෙන් තොර කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීමට අපේක්ෂිත කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?